# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 6 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 පෙබරවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

## 2009 අංක 6 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 62/2007.

**2003 අංක 35 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 6 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 35 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2003 අංක 35 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබිය යුතු අතර" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි විය යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ඉහත සඳහන් කළ ස්ථිර පදිංචිකරුවකු ඉන්දියානු ගමන් බලපත්‍රයක් හෝ වෙනත් සමාන ලේඛනයක් දරන අවස්ථාවක, එම තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය පිළිබඳ තත්ත්වය, ඔහු විසින් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ස්වේච්ඡාවෙන් ම අත් කර ගැනීමට ඔහුගේ ඇති චේතනාව සඳහන් කරමින් උපලේඛනයේ දක්වා ඇති විශේෂ ප්‍රකාශන ආකෘතියෙහි වූ ප්‍රකාශයක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර, එම ප්‍රකාශය කොමසාරිස්වරයා විසින් ලිඛිතව පිළිගනු ලැබීමේ දී පමණක් බලාත්මක විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 2අ වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ඇතැම් තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

2අ. 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු ලෙස සිටි ඉන්දීය සම්භවයක් සහිත යම් තැනැත්තකුට හෝ එවැනි තැනැත්තකුගෙන් පැවත එන්නකු වන තැනැත්තකුට, එම තැනැත්තාගේ පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත කරුණු හේතුවෙන්—

(අ) ශ්‍රී ලංකාව හැර යාමට සිදු වූයේ නම් ; සහ

(ආ) ඉන් පසුව ඔහු ඉන්දියාවේ පදිංචි වූයේ නම්,

සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔහුට 2 වන වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකිව තිබේ නම්, ඔහු 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකුව සිටි ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තකු බවට හෝ 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකුව සිටි ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තකුගෙන් පැවත එන තැනැත්තකු බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට එම තැනැත්තාට හැකි වන්නේ නම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි, එම තැනැත්තාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි විය යුතු අතර, නීතිය මගින් ශ්‍රී ලංකාවේ වෙනත් පුරවැසියන්ට හිමිකම ඇති සියළුම අයිතිවාසිකම්වලට සහ වරප්‍රසාදවලට ඒ තැනැත්තාට ද හිමිකම තිබිය යුතු ය :

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, ඉහත සඳහන් කළ යම් තැනැත්තකු ඉන්දියානු ගමන් බලපත්‍රයක් හෝ වෙනත් සමාන ලේඛනයක්

දරන අවස්ථාවක, එම තැනැත්තාගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය, ඔහු විසින් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ස්වේච්ඡාවෙන් ම අත් කර ගැනීමට ඔහුගේ ඇති චේතනාව සඳහන් කරමින් උපලේඛනයේ දක්වා ඇති විශේෂ ප්‍රකාශන ආකෘතියෙහි වූ ප්‍රකාශයක්, කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර, එම ප්‍රකාශය කොමසාරිස්වරයා විසින් ලිඛිතව පිළිගනු ලැබීමේ දී පමණක් බලාත්මක විය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) “2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2 වන වගන්තියේ හෝ 2අ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) “සාමාන්‍ය ප්‍රකාශයක් සමග ඉදිරිපත් කළ යුතු ය.” යන වචන වෙනුවට, “සාමාන්‍ය ප්‍රකාශයක් සමග ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුව ද, 2අ වගන්තියේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය සඳහා හිමිකම ඇති යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචිවීමේ චේතනාව ඇතිව ශ්‍රී ලංකාවට පැමිණීමේ දී පමණක් එම තැනැත්තා විසින් මේ පනත යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.